(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 12(4).]

# පාර්ලිමේන්තුවේ අංක 12 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2014 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා**

---

**2014 ඔක්තෝබර් මස 09 වැනි බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4847/’14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ සූදු ව්‍යාපාරය කරගෙන යාම සඳහා මේ දක්වා නිකුත් කර ඇති බලපත්‍ර ප්‍රමාණය කොපමණද;

(ii) එවන් බලපත්‍ර ලබාගෙන ඇති පුද්ගලයන්ගේ සහ / හෝ සමාගම්වල නම් කවරේද;

(iii) එම එක් එක් බලපත්‍රය නිකුත් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,—2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු, 34 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 සැප්තැම්බර් 05 දිනැති අංක 1878/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.09.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2014 ඔක්තෝබර් මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4712/'14

ගරු මොහමඩ් අස්ලම් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) මුරුන්කන් පොලිස් වසමට අයත්, මලුවරායර්, කට්ටෙයි, අඩම්පන්, මඩුපාර, මුරුක්කන් ලිපිනයේ පදිංචිව සිටි මාරිමුත්තු ෂන්මුගම් මහත්මිය සහ ඇයගේ පවුලේ සාමාජිකයන් එල්.ටී.ටී.ඊ. තර්ජන හමුවේ එම නිවස හැර ගොස් සරණාගතයින් ලෙස වෙනත් ප්‍රදේශයක ජීවත් වූ කාල සීමාව තුළ දී ඔවුන්ගේ නිවස පිහිටි ස්ථානයේ අධි බලැති විදුලි රැහැන් යෙදීම සඳහා වූ මහා පරිමාණයේ විදුලි කුළුණක් ඉදිකරනු ලැබ ඇති බවත්;

(ii) ඔවුන්ගේ නිවස ඉවත් කොට එම ස්ථානයේ විදුලි කුළුණක් ඉදිකිරීම වෙනුවෙන් මාරිමුත්තු ෂන්මුගම් මහත්මියට වන්දි මුදල් ලබා දීම නිර්දේශ කරමින්, ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් අංක DGM (P&HM-R1) GEN හා 2011.07.07 දිනැති ලිපිය මගින් වව්නියාවේ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරු වෙත ලිඛිතව දැනුම් දී ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) පදිංචි නිවස අහිමි වී අසරණභාවයට පත්ව සිටින ෂන්මුගම් මහත්මියට ලබාදිය යුතු වන්දි මුදල් මෙතෙක් ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම වන්දි මුදල් නොපමාව ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ඔක්තෝබර් මස 21 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2691/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ පවතින මානව සහ භෞතික සම්පත්වල ඌනතාවයන් කවරේද;

(ii) මෙම ඌනතාවයන් සහ අඩුපාඩුකම් සම්පූර්ණ කිරීමට කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලයේ ඇති පීඨ සංඛ්‍යාව කොපමණද;

(iii) 2012 වර්ෂය සඳහා එම විශ්වවිද්‍යාලයට වෙන් කළ ප්‍රතිපාදනවල මුළු වටිනාකම කොපමණද;

(iv) එම මුදල 2011 වර්ෂය සඳහා වෙන්කළ මුදලට සාපේක්ෂව වැඩි හෝ අඩුවී ඇති ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3270/'12

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අද වන විට දිවයිනේ සිටින සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2011 සහ 2012 වසරවල දෙසැම්බර් 31 දින වන විට සිටි සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එබඳු සමාජ සහනාධාරයක් ලබාදීම පිණිස සලකා බලන නිර්ණායක කවරේද;

(iv) 2010, 2011 සහ 2012 වර්ෂවලදී මාසිකව සහ වාර්ෂිකව ඔවුන්ට ලැබුණු දීමනාව මත පදනම්ව සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාවේ ප්‍රභේදනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මිලදී ගැනීමේ ශක්තිය හෝ ක්‍රය ශක්තිය හෝ උද්ධමන ප්‍රවණතාවන්ට සාපේක්ෂව සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා අරමුදල් නැවත වෙන්කිරීමක් සිදුකර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3958/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ අලි - මිනිස් ගැටුම නිසා වාර්ෂිකව විශාල මිනිස් ජීවිත සංඛ්‍යාවක් අහිමි වන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එසේ අහිමිවූ මිනිස් ජීවිත සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් කාල සීමාව තුළදී අලි - මිනිස් ගැටුම් හේතුවෙන් විනාශ වූ මිනිස් ජීවිත හා දේපළ වෙනුවෙන් ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර, මිදිගම රජයේ රෝහලේ විශ්‍රාමික වෛද්‍ය සරත් විමලසූරිය මහතා අලි - මිනිස් ගැටුමට විසඳුමක් ලෙස විදුලි වැටක් නිර්මාණය කර ඇති බවත්;

(ii) මෙම උපකරණය පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගැනීමට වනජීවී නිලධාරීන් ලබා ගෙන ඇති බවත්;

(iii) එය මේ දක්වා ආපසු ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) වෛද්‍ය සරත් විමලසූරිය මහතා විසින් අඩු වියදමින් නිර්මාණය කරන ලද විදුලි වැට පරීක්ෂා කර බලා එය අලි - මිනිස් ගැටුමට විසඳුමක් ලෙස භාවිතයට ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4296/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය සපයනු ලබන ජල මූලාශ්‍රය කවරේද;

(ii) එකී ජල මූලාශ්‍රයෙන් ජලය සපයනු ලබන ආයතනය කවරේද;

(iii) 2013 වර්ෂයේ ජූනි මාසයේ සිට ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ජනතාව මුහුණ දුන් පානීය ජල හිඟයට හේතු කවරේද;

(iv) එම පානීය ජල හිඟය මඟහැරවීම සඳහා ගත් කඩිනම් ක්‍රියාමාර්ග කවරේද;

(v) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පවතින පානීය ජලය හිඟවීමේ ගැටලුව විසඳීම සඳහා අමතර ජල සැපයුම් මූලාශ්‍රයක් යොදා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4443/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ නව නිවාස ඉදිකර දීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ හඳුනාගෙන තිබූ නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් වෙනුවෙන් නිවාස ඉදිකිරීම සඳහා රජය මගින් ලබා දීමට අපේක්ෂා කළ ප්‍රතිපාදන කවරේද;

(iii) එකී ප්‍රතිපාදන මත සිදුකළ නිවාස ඉදිකිරීම් කටයුතු 2014 දැයට කිරුළ ප්‍රදර්ශනය ආරම්භ කිරීමට පෙර නිමකර ජනතා අයිතියට පත් කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4464/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 වර්ෂය තුළ දී පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ හැඳුනුම්පත් සකස් කිරීම සඳහා යොදා ගනු ලබන ආරක්ෂිත කාඩ්පත් 11ක් සහ මල්ටිමීඩියා යන්ත්‍ර 02ක් අතුරුදහන් වී තිබේද;

(ii) එසේ නම්, එම අතුරුදහන්වීම් පිළිබඳව දෙපාර්තමේන්තු මට්ටමින් පරීක්ෂණ පවත්වා ඊට වගකිවයුත්තන් හඳුනා ගනු ලැබ තිබේද;

(iii) සිදුවී ඇති අලාභය ඔවුන්ගෙන් අයකර ගනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් සිද්ධියට අදාළව කුරුඳුවත්ත පොලීසිය විසින් කරගෙන යනු ලබන පරීක්ෂණ මගින් අදාළ උපකරණ හා ද්‍රව්‍ය සොයාගනු ලැබ හෝ වරදකරුවන් හඳුනාගනු ලැබ තිබේද;

(ii) ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනයක සිදු වූ මෙම සිදුවීම පිළිබඳව රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4640/'13

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂි රසායන ද්‍රව්‍ය ආනයනය සඳහා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සමාගම් අතරින් කෘෂි රසායන ද්‍රව්‍ය මහා පරිමාණයෙන් ආනයනය කරන ආයතන කවරේද;

(iii) මේ වන විට ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කරනු ලැබ ඇති කෘෂි රසායන වර්ග සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම්වල නම්, ලිපිනයන් හා ලියාපදිංචි වූ දිනයන්;

(ii) තහනමට ලක්වන තෙක් එම කෘෂි රසායන ද්‍රව්‍ය මෙරටට ගෙන්වනු ලැබූ සමාගම්වල නම්;

(iii) තහනම් කරන ලද කෘෂි රසායන ද්‍රව්‍ය ලංකාවට ගෙන්වීම නිසා අසාධු ලේඛනගත (Black list) කර ඇති ආයතනවල නම්;

එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) අසාධු ලේඛනගත කිරීමට ලක්වන ආයතනවල අධ්‍යක්ෂවරුන් වෙනත් නම්වලින් ආයතන ලියාපදිංචි කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ අය සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4761/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා 2012 වර්ෂයේ වෙන් කළ මුදල කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි කර ඇති කුකුළු ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(iv) ස්වයං රැකියාවක් ලෙස සුළු පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධනය සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4796/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2013 වර්ෂයේදී විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය මඟින් ඉතාලියේ හෝටල් ක්ෂේත්‍රයේ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයින් යොමු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, යොමු කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එම පිරිස තෝරා ගත් පදනම කවරේද;

(ii) එම පිරිස තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීම හෝ වෙනත් ප්‍රචාරණ විධි ක්‍රමයක් අනුගමනය කරනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4798/'14

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු තාප බලාගාරයේ විදුලි උත්පාදනය ආරම්භ කළ දින සිට මේ දක්වා එය අක්‍රිය වූ වාර ගණන සහ එක් එක් අවස්ථාවේදී අක්‍රියව තිබූ කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ දක්වා එය අක්‍රිය වූ අවස්ථාවන්හිදී එහි අලුත්වැඩියා කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(iii) එම අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් වැය වූ මුදල බලාගාරය අක්‍රිය වූ එක් එක් අවස්ථාව අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම අක්‍රියවීම් අදාළ උපකරණවල වගකීම් කාලය තුළ සිදු වූයේ නම්, ඉහත පරිදි මුදල් වැය කිරීමට හේතු කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ සිදුවූ අක්‍රියවීම් හේතුවෙන් එම කාල සීමාවන් තුළ වෙනත් බලාගාර ඔස්සේ ජාතික විදුලිබල පද්ධතියට විදුලිය එක් කිරීම සඳහා වැය කළ අතිරේක මුදල කොපමණද;

(ii) ඉහත තාප විදුලි බලාගාරයේ බිඳ වැටීම් හේතුවෙන් වැය වූ අතිරේක මුදල එකතු කළ විට විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා කොපමණ මුදලක් වැය වී තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4941/'14

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආරම්භ කළ දින සිට වාර්ෂිකව, එක් එක් උසස් අධ්‍යාපන ආයතනය මට්ටමින් මහපොළ ශිෂ්‍යත්ව වැඩ සටහන මගින් මූල්‍යාධාර ලැබූ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 1981 සිට මේ දක්වා මහපොළ ශිෂ්‍යත්ව යටතේ මූල්‍යාධාර ලැබූ සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා දායක මුදල් ලැබෙන මාර්ග කවරේද;

(ii) මහපොළ ශිෂ්‍යත්ව ලබා දීම සඳහා අඩු ආදායම් ලබන සිසුන් තෝරා ගැනීම සෑහීමකට පත් විය හැකි, නිසි ක්‍රමවේදයක් අනුව සිදු වන්නේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) උසස් අධ්‍යාපන කටයුතු අවසන් කළ මහපොළ ශිෂ්‍යත්වලාභීන් ඉන් ලබා ගන්නා ප්‍රයෝජන පිළිබඳව පසු විපරමක් සිදු කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5027/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වන විට දේශීය වෙළඳපොළෙහි අලෙවි කරනු ලබන ශක්තිජනක පාන (Energy Drinks) වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාන අතර ඇති දේශීයව නිෂ්පාදනය කරනු ලබන පාන වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ශක්තිජනක පානයන්හි ගුණාත්මකභාවය හා සෞඛ්‍යාරක්ෂිතභාවය තීරණය කරනු ලබන නිර්ණායක කවරේද;

(iv) 2014 වර්ෂ තුළදී ශක්තිජනක පාන සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5072/'14

ගරු තිස්ස අත්තනායක මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ විශේෂ ව්‍යාපෘති මෙහෙයුම් අධ්‍යක්ෂ ලෙස තනතුරක් තිබේද;

(ii) එම තනතුරට අයත් කාර්ය භාරය කවරේද;

(iii) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තුළ එම තනතුර ආරම්භ කළ වර්ෂය සහ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශේෂ ව්‍යාපෘති මෙහෙයුම් අධ්‍යක්ෂ ලෙස කටයුතු කරනු ලබන පුද්ගලයාගේ නම කවරේද;

(ii) එම තනතුර දැරීම සඳහා එම පුද්ගලයා සතු අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) එකී තනතුර සඳහා හමුදා නිලධාරියකු පත් කිරීමේ අරමුණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5199/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිම් සවිය වැඩ සටහනේ මූලික පරමාර්ථ කවරේද;

(ii) අධිකරණය මගින් ලබාදුන් තීන්දුවකට පටහැනි ලෙස බිම් සවිය වැඩ සටහන යටතේ ඉඩම් මැනීමක් සිදු කිරීමට හැකියාවක් තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් මැනීම කවර නීති ප්‍රතිපාදනයක් යටතේ සිදු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හෝමාගම දිසා අධිකරණයේ, නඩු අංක 2061 බෙදුම් නඩුවේ අවසන් තීන්දුව අනුව කොටස් 3කට කැබලි කළ ඉඩමක් එම තීන්දුවට පටහැනිව බිම් සවිය නිලධාරීන් විසින් කොටස් 2කට කැබලි කර ඇති බව දන්නේද;

(ii) එම ඉඩම එසේ බෙදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5259/'14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙල්තොට - පල්ලේගම ප්‍රධාන මාර්ගය දීර්ඝ කාලයක සිට දැඩි ලෙස අබලන්ව ඇති බැවින් එම මාර්ගය භාවිතා කරන ජනතාව බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙන බවත්;

(ii) වැසි කාලයේදී එම මාර්ගය භාවිතා කරන පාසල් සිසුන් බොහෝ දුෂ්කරතා වලට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දෙල්තොට හා පල්ලේගම ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ සුබසිද්ධිය උදෙසා එම ප්‍රධාන මාර්ගය ඉතා කඩිනමින් ප්‍රතිසංස්කරණය කර දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ඔක්තෝබර් මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2693/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර විශ්වවිද්‍යාලය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) එම විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන වත්මන් ශිෂ්‍ය සංඛ්‍යාව සහ සේවය කරනු ලබන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම විශ්වවිද්‍යාලය යටතේ ඇති පීඨ සංඛ්‍යාව කොපමණද;

(iv) එම පීඨ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නැගෙනහිර විශ්වවිද්‍යාලය තුළ පවතින මානව හා භෞතික සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) මෙම ඌනතාවයන් සහ අඩුපාඩුකම් සම්පූර්ණ කිරීමට කටයුතු කරන දිනය කවරේද;

(iii) එම විශ්වවිද්‍යාලය සඳහා සංවර්ධන සැලැස්මක් තිබේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(v) එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට වැයවන මුදල කොපමණද;

(vi) එම මුදල් ප්‍රතිපාදන ලබාදීමට රජය පියවර ගන්නා කාල වකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3309/'12

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ මේ වනවිට තිබෙන රජයේ සමස්ත රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත කී එක් එක් රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව තුළ සිටිය යුතු වෛද්‍යවරුන්, හෙදියන්, සාත්තු සේවකයන්, කම්කරුවන් සහ අනෙකුත් ශ්‍රේණිවල නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්තමානයේ එම රෝහල්වල සේවය කරන, ඉහත එක් එක් තනතුරට අදාළ කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත කී රෝහල්වල පුරප්පාඩු කිසිවක් හෝ තිබේ නම්, ඒවා පිරවීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එය කවර කාලසීමාවක් තුළ සිදුකරනු ලබන්නේද;

(vi) ඉහත කී රෝහල්වල අතිරික්ත කාර්ය මණ්ඩල සිටින්නේ නම්, ඔවුන් අනුයුක්ත කරනු ලබන කාර්යයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3960/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලුණුවිල පොල් පර්යේෂණ ආයතනය යටතේ ඇති වතුවල සිටි කිරි ගවයින් 300ක් පමණ ව්‍යාජ ටෙන්ඩර් කැඳවීමක් සිදුකරමින් මස් සඳහා විකුණා ඇති බවත්;

(ii) එම ගවයින් අතර කිරි එළදෙනුන්, වසුපැටවුන් සහ ගැබ්බර එළදෙනුන් සිටි බවත්;

(iii) රජයේ නීති රීති අනුව මස් පිණිස අලෙවි කළ හැක්කේ පිරිමි ගවයින් (ගොනුන්) පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි විකුණා ඇති එක් එක් ගවයාගේ වයස හා බර වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ගවයින් මිලදී ගෙන ඇති පුද්ගලයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ගවයින් අලෙවි කිරීම සිදුකොට ඇත්තේ පවතින නීති රීතිවලට පටහැනිව බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම වංචනික ගනුදෙනුව පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4091/'13

ගරු අනුර දිසානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂය තුළ සපුගස්කන්ද තෙල් පිරිපහදුව ක්‍රියා විරහිතව තිබූ දින තිබුණේද;

(ii) එසේ ක්‍රියා විරහිත කිරීමට හේතු වූ කරුණු කවරේද;

(iii) බොර තෙල් නියමිත පරිදි සපයා ගැනීමට නොහැකි වීමෙන් පිරිපහදුව වසා දමා තිබුණේද;

(iv) එම දිනයන් කවරේද;

(v) බොර තෙල් නොමැතිකමින් පිරිපහදුව වසා දැමීම නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වූ අලාභය දළ වශයෙන් කොපමණද;

(vi) බොර තෙල් හිඟවීම පිළිබඳව පරීක්ෂණයක් පවත්වා තිබේද;

(vii) එසේ නම්, එම පරීක්ෂණයෙන් වරදකරුවන් වූවන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4227/’13

ගරු රන්ජන් රාමනායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) 2004 වර්ෂයේ සිට මේ දක්වා මහජන ඡන්දයෙන් තේරී පත්වූ ප්‍රාදේශීය සභා නියෝජිතයින්, නගර සභා නියෝජිතයින් සහ පළාත් සභා නියෝජිතයින් අතරින් මේ වන විට දූෂණ, අපරාධ හෝ වෙනත් නීති විරෝධී ක්‍රියා සිදුකිරීම හේතුවෙන් චෝදනා එල්ලවී ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, අයත් දේශපාලන පක්ෂ සහ ඔවුන් පළාත් සභාවේ, නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ දැරූ හෝ දැනට දරන තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් මහජන නියෝජිතයින් අතරින් මේ වන විට නීති මගින් කටයුතු කිරීම ආරම්භකර ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට නීතිය ඉදිරියට පමුණුවා වරදකරුවන් වී, දඬුවම් ලැබූවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි දූෂිත පිරිස් පළාත් සභා සහ පළාත් පාලන ආයතන නියෝජනය කිරීම සංවිධානාත්මක දූෂණ, අපරාධ හා නොයෙකුත් නීති විරෝධී ක්‍රියාකාරකම් තවදුරටත් සිදුවීමට හේතු වී ඇති බව පිළිගන්නේද;

(ii) නීති විරෝධී ක්‍රියාවන්හි යෙදෙන දූෂිතයන් හා අපරාධකරුවන් ප්‍රාදේශීය හා පළාත් සභා දේශපාලනයට පිවිසීම වැළැක්වීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4297/’13

ගරු රෝසි සේනානායක මහත්මිය,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ගබඩාවල ඇති අතිරික්ත වී තොග සත්ත්ව ආහාර සඳහා අඩුමිලට විකිණීමට තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම වී තොග අඩු මිළට සත්ත්ව ආහාර වෙනුවෙන් විකිණීමට හේතු කවරේද;

(iii) රජයේ ගබඩා මගින් වී මිළදී ගැනීමේදී තෙතබර පරීක්ෂා කිරීමක් සිදුවේද;

(iv) මිලදී ගැනීමේදී වී තොගවල තිබිය යුතු තෙතබර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4568/'13

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විසින් වැඩිම විදේශ විනිමය ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට උපයා දෙන මැද පෙරදිග රටවල් දහය කවරේද;

(ii) එම එක් එක් රටෙහි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සෑම රටකම ශ්‍රී ලංකා තානාපති කාර්යාල පිහිටා තිබේද;

(iv) එම එක් එක් තානාපති කාර්යාලයෙහි සේවය කරනු ලබන භාෂා පරිවර්තක නිලධාරීන් සහ කම්කරු නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම රටවල සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සංඛ්‍යාවට සාපේක්ෂව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් තානාපති කාර්යාලවල සේවයේ යොදවා නොමැති බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් එම රටවලදී පොලිස් අත්අඩංගුවට පත්වුවහොත්, එම අවස්ථාවේදීම ඒ බව ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට දැනුම් දීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් වී තිබේද;

(ii) ශ්‍රී ලංකාව සහ එම රටවල් අතර අවබෝධතා ගිවිසුම් ඇති කර එවැනි ක්‍රමවේදයක් සකසා ගැනීම තුළ නීතිමය ප්‍රශ්නවලට මුහුණ දෙන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට තානාපති කාර්යාලවල රැකවරණය ලබා ගැනීම සඳහා අවස්ථාව සැලසෙන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4586/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (4)

(අ) (i) නොරොච්චෝලේ විදුලි බලාගාරයෙහි භාවිතා කිරීම පිණිස මෑතකදී ආනයනය කළ ගල් අඟුරු පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් අරඹා තිබේද;

(ii) ඉහත කී ආනයනයට සම්බන්ධ ගල් අඟුරු ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත කී කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් අරඹා ඇත්තේ මන්ද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කී ගල් අඟුරු බහාලුමෙහි ආනයනකරුගේ නම කවරේද;

(ii) ඉහත කී ආනයනකරු තෝරාගත්තේ කෙසේද;

(iii) ආනයනකරුගෙන් අලාභය අය කර ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

(iv) ගල් අඟුරු ආනයනය සම්බන්ධයෙන් අනාගතයේදී එවැනි තත්ත්වයක් නැවත ඇතිවීම වළක්වා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4641/'13

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වකුගඩු රෝගය පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සඳහා 2012 නොවැම්බර් මස අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කරනු ලැබුවේද;

(ii) එම කමිටුවට පත් කළ අමාත්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් විද්වත් කමිටුවක් පත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම විද්වත් කමිටුව විසින් වකුගඩු රෝගය වළක්වා ගැනීමට සහ රෝගීන් රැක බලා ගැනීමට ඉදිරිපත් කරන ලද නිර්දේශ කවරේද;

(iv) එම නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක වන්නේද;

(v) එසේ නම්, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4767/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරටට වාර්ෂිකව ආනයනය කරන තිරිඟු ප්‍රමාණය කොපමණද;

(ii) එහි වටිනාකම කොපමණද;

(iii) වාර්ෂිකව ආනයනය කරනු ලබන තිරිඟු පිටි ප්‍රමාණය කොපමණද;

(iv) දිනකට පරිභෝජනය කරනු ලබන පාන් ප්‍රමාණය කොපමණද;

(v) පාන් පරිභෝජනය අඩු කිරීම සඳහා ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4942/'14

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කිතුල් වගාව ඉතා බහුලව පවතින ප්‍රදේශ කවරේද;

(ii) කිතුල් වගාවේ යෙදෙන හා කිතුල් ආශ්‍රිත නිෂ්පාදන මගින් ආදායම් ලබන සංඛ්‍යාව කොපමණද;

(iii) කිතුල් වගාවේ යෙදී සිටින අය එම වගාව යාය/වතු මට්ටමින් සිදු කරන්නේද;

(iv) කිතුල් වගාව වැඩි දියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) කිතුල් නිෂ්පාදන විදේශයන්හි ජනප්‍රිය කරවීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, එම වැඩසටහන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කිතුල් ආශ්‍රිත නිෂ්පාදන වර්ග කවරේද;

(ii) ඒවායේ වාර්ෂික නිෂ්පාදනයන් පිළිබඳව ඇගයීමක් කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රමාණයන් කවරේද;

(iv) කිතුල් වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්තයන්හි සේවයේ නියුතු රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව එක් එක් තනතුර අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එම සේවකයින්ගේ වැටුප් හා වෙනත් දීමනා ගෙවීම වෙනුවෙන් රජය වාර්ෂිකව වැය කරන මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) කිතුල් නිෂ්පාදන කර්මාන්තයෙන් රජය ලබන ආදායම කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5034/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වයඹට මහවැලි ජලය හැරවීමේ වැඩ සටහන නමින් වැඩ සටහනක් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩ සටහනෙහි අරමුණු කවරේද;

(iii) මේ වන විට ඒ යටතේ ආරම්භ කර ඇති ප්‍රධාන ව්‍යාපෘති කවරේද;

(iv) එම වැඩ සටහන සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(v) එම මූල්‍ය ප්‍රතිපාදන සපයා ගනු ලබන මූලාශ්‍ර කවරේද;

(vi) වයඹට මහවැලි ජලය හැරවීමේ වැඩසටහන සම්පූර්ණයෙන් නිම කිරීමට අපේක්ෂිත කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5168/'14

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිබිල, දියකොබල, 'මයුරසිරි' හි පදිංචි ඒ. එම්. කරුණාපාල මහතා, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයෙකු ලෙස වර්ෂ 1980.12.16 දින සේවයට බැඳී වර්ෂ 2013.06.24 දින විශ්‍රාම ගත් බවත්;

(ii) වර්ෂ 32ක සේවා කාලයක් සපුරා ඇති ඒ මහතාට රු.1,250,400.00ක පාරිතෝෂික මුදලක් හිමි විය යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඒ. එම්. කරුණාපාල මහතාට හිමි පාරිතෝෂික මුදල කඩිනමින් ඔහුට ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5201/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනතේ 13(ඉ) උප වගන්තිය ප්‍රකාරව, කැබිනට් මණ්ඩල තීරණයක් පරිදි දක්ෂිණ සංවර්ධන මූල්‍ය සමාගම පිහිටුවා ඇති බව දන්නේද;

(ii) දිවිනැගුම පනත යටතේ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියට අයත්ව තිබූ ඉහත සමාගම වසා දැමීමට තීරණය කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමතිය ගෙන තිබේද;

(iv) එම සමාගමේ සේවකයින්ගේ සේවය 2014 අප්‍රේල් මස 30 වැනි දිනෙන් අවසන් කරන බව ඔවුන්ට ලිඛිතව දැනුම් දී තිබේද;

(v) එම සේවකයන්ගේ රැකියා අහිමි කිරීම තුළ සාධාරණත්වයක් තිබේද;

(vi) එම සමාගමට අයත් දේපළ සහ වාහන දක්ෂිණ සංවර්ධන අධිකාරිය යටතට පවරා ගෙන තිබේද;

(vii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5359/'14

ගරු ඒ. විනායගමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පලාලි ගුවන් තොටුපළේ ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(ii) එය මහජනතාව සඳහා විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ඔක්තෝබර් මස 24 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2695/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, මහපැලැස්ස ගම්මානය ආශ්‍රිතව ලොව ප්‍රචලිත මදුනාගල උණුදිය උල්පත් පිහිටා ඇති බවත්;

(ii) එම උණුදිය උල්පත් ආශ්‍රිත ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කළ බවත්;

(iii) මේ වන විට එම ප්‍රදේශයට දෙස් විදෙස් සංචාරකයන් විශාල සංඛ්‍යාවක් පැමිණෙන බවත්;

(iv) උණුදිය උල්පත් ආශ්‍රිත ප්‍රදේශයේ සංවර්ධනයට ලක්වූ සංචාරකයින් සඳහා වූ පහසුකම් මේ වනවිට ගරා වැටෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මදුනාගල උණුදිය උල්පත් ආශ්‍රිත සංචාරක කලාපයේ පවතින අඩුපාඩුකම් සම්පූර්ණ කිරීමට ඉලක්කගත වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඊට අදාළ දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3310/'12

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 දෙසැම්බර් 31 වැනි දිනට සහ අද වනවිට විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට අද දක්වා, විදේශ රැකියා මගින් රට තුළට ගලා ආ මුළු විදේශ ප්‍රේෂණ ප්‍රමාණය ඇමරිකා එක්සත් ජනපද ඩොලර්වලින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සේවා ගිවිසුම් කඩකිරීම හේතුවෙන් සෑම වර්ෂයකම පිටුවහල් කෙරෙන හෝ ආපසු එවන විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

(iv) විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයන්ගෙන් රක්ෂණ යෝජනා ක්‍රමය හරහා උපයා ගන්නා මුදල් ප්‍රමාණය කොපමණද;

(v) ඉහත සඳහන් රක්ෂණ අරමුදල්වලින් එතෙර සේවය කරන ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් වැය කරන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4086/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කර ඇති නියෝජ්‍ය තැපැල්පති සේනාධීර මහතාට එරෙහිව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ I වැනි උපලේඛනය යටතේ චෝදනා පත්‍ර දෙකක් ඉදිරිපත් කර ඇති බවත්;

(ii) ඉන් එක් චෝදනා පත්‍රයක සඳහන් වූ චෝදනාවකට වැරදිකරු වූ බැවින් ඔහුට දඬුවම් ලබා දී ඇති බවත්;

(iii) අනෙක් චෝදනා පත්‍රය සම්බන්ධයෙන් මේ දක්වා විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නොමැති බවත්;

(iv) මෙම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීමට නියෝජ්‍ය තැපැල්පති කේ. ඒ. එස්. සේනාධීර මහතාට සුදුසුකම් නොමැති බවට විගණකාධිපතිවරයා විසින් දන්වා ඇති බවත්;

(v) සේනාධීර මහතා ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස අයථා ලෙස ලබාගෙන ඇති මුදල් ආපසු අය කර ගන්නා ලෙස විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සේනාධීර මහතා සම්බන්ධයෙන් ඉතිරිව ඇති අනෙක් චෝදනා පත්‍රය පිළිබඳව විධිමත් විනය පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන්නේද;

(ii) ව්‍යාපෘති අධ්‍යක්ෂ වශයෙන් ඔහු අයථා අන්දමින් ලබාගෙන ඇති මුදල් අය කර ගැනීම සඳහා විනයානුකූලව කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4281/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ ජුනි මාසයේ සිට රජයේ රෝහල් සඳහා දියවැඩියා රෝගීන්ගේ රුධිරයේ 'ග්ලූකෝස්' මට්ටම පරීක්ෂා කිරීමට යොදා ගන්නා පටි (Blood Glucose Test Strips) මිලදී ගනු ලැබූ සමාගම කවරේද;

(ii) එම සමාගමෙන් මිලදී ගනු ලැබූ එම උපාංග ප්‍රමාණය කොපමණද;

(iii) එම "Glucose Test Strip" එකක ගැණුම් මිල කොපමණද;

(iv) රජයේ රෝහල්වල 2013 අගෝස්තු මාසයේ සිට මෙම Glucose Test Strips වල හිඟයක් හෝ සම්පූර්ණයෙන්ම නොමැති බවක් වාර්තා වී තිබේද;

(v) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4571/'13

ගරු අනුර දිසානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2011 සිට මේ දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් එක් එක් වරාය වෙත පැමිණි නැව් සංඛ්‍යාව හා හුවමාරු වූ බහාළුම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ ඉහත එක් එක් වරායේ මෙහෙයුම් ලාභය හෝ පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමස්තයක් වශයෙන් ඉහත කාල සීමාව තුළ ලැබූ ආදායම හා ලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4671/'13

ගරු පී. හැරිසන් මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සමුළුව පවත්වනු ලැබූ ප්‍රදේශය සහ හෝටලය කවරේද;

(ii) එම සමුළුවට සහභාගී වූ ව්‍යාපාරිකයින් නියෝජනය කරන ලද රටවල් සංඛ්‍යාව කොපමණද;

(iii) එකී සමුළුව සඳහා ශ්‍රී ලංකා රජය වැය කළ මුදල සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමුළුවෙන් පසුව ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් බදු සහන ලබා දී තිබේද;

(ii) එමගින් ශ්‍රී ලංකා රජයට හා ජනතාවට ලැබෙන වාසි වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සමුළුවට පැමිණි ව්‍යාපාරිකයන් විසින් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට වැඩි කැමැත්තක් දැක්වූ විශේෂ ව්‍යාපෘති තිබේද;

(ii) එසේ නම්, ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4768/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකාවේ ඇති උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) රජය මගින් කුලී ගෙවමින් පවත්වා ගෙන යනු ලබන උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) උප තැපැල් ස්ථානාධිපතිවරුන්ගේ පෞද්ගලික මුදලින් කාර්යාල ගොඩනැගිලි සඳහා වන කුලිය ගෙවීම නවතාලීමට පියවර ගන්නේද;

(iv) රු. 250/- ක වන ගොඩනැගිලි කුලී දීමනාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4856/'14

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන නිවාස වැඩසටහන් කවරේද;

(ii) මේ වන විට එම වැඩසටහන් යටතේ ගොඩ නගා, ජනතාවට ලබා දී ඇති නිවාස ව්‍යාපෘති කවරේද;

(iii) එම නිවාස ව්‍යාපෘති යටතේ නිවාසලාභීන් තෝරා ගැනීමේදී අනුගමනය කළ ක්‍රියා පිළිවෙත කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් නිවාස ව්‍යාපෘති යටතේ නිවාස ලබා දුන් අයගේ නාම ලේඛනයක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මෑතක දී ජනතාවට පවරා දී ඇති මාළිගාවත්ත නිවාස සංකීර්ණය එහි මුල් පදිංචිකරුවන්ට ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) 2014 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ නිවාස වැඩසටහන්වල ඉලක්ක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4871/'14

ගරු තිස්ස අත්තනායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) නොරොච්චෝල තාප බලාගාරයේ බිඳ වැටීම් සහ නඩත්තු කටයුතු හේතුවෙන් නිෂ්පාදන කටයුතු නවතා දැමීම නිසා ජාතික විදුලිබල පද්ධතියට මේ දක්වා අහිමි වූ විදුලි ධාරිතාවය කොපමණද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014 පෙබරවාරි 13 වැනි දින නොරොච්චෝල තාප බලාගාරයේ කන්ඩෙන්සර් පද්ධතියට ලුණු හෝ ඒ හා සමාන කිසියම් රසායනික ද්‍රව්‍යයක් එකතු කර ඇති බවට ඉදිරිපත් වූ ප්‍රකාශයෙහි සත්‍යතාවයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව මේ වන විට සිදු කර ඇති පරීක්ෂණ කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් වරදකරුවන් වූ පුද්ගලයෝ කවුරුන්ද;

(iv) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5035/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුදු පොල්තෙල් (Virgin Coconut Oil) සඳහා ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉහළ ඉල්ලුමක් පවතින බවත්;

(ii) අධික මිල ගණන් යටතේ අලෙවි වන සුදු පොල්තෙල් අපනයනය කිරීමෙන් විශාල වශයෙන් විදේශ විනිමය උපයා ගැනීමේ අවස්ථාවක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙරට ඇති සුදු පොල්තෙල් නිපදවනු ලබන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) වාර්ෂිකව නිපදවනු ලබන සුදු පොල්තෙල් ප්‍රමාණය කොපමණද;

(iii) 2013 වර්ෂයේදී සුදු පොල්තෙල් අපනයනයෙන් ලැබූ ආදායම කොපමණද;

(iv) එම කර්මාන්තකරුවන් සඳහා රජය මගින් ලබාදී ඇති අනුග්‍රහයන් කවරේද;

(v) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සුදු පොල්තෙල්වල තත්ත්වය උසස් මට්ටමක පවත්වා ගැනීම සඳහා සම්මත තත්ත්ව පාලන ක්‍රමවේදයක් හඳුන්වා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5174/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංකා බැංකුවට, මහජන බැංකුවට සහ වෙනත් බැංකුවලට ගෙවිය යුතුව ඇති ණය සහ පොලී ප්‍රමාණය කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5180/'14

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය මැතිවරණ කොට්ඨාසයේ, වැලිපැන්නගහමුල්ල තැපැල් කාර්යාලය ඉදිකිරීම සඳහා අවසන් වරට මුල්ගල තබන ලද දිනය කවරේද;

(ii) එකී තැපැල් කාර්යාලය ඉදිකිරීම වෙනුවෙන් මුල්ගල් තබන ලද වාර ගණන කොපමණද;

(iii) එම එක් එක් අවස්ථාවේදී පවත්වනු ලැබූ උත්සව සඳහා සිදුකළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දැනට අපහසුතා මධ්‍යයේ පවත්වාගෙන යන ඉහත තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු යොදා තිබේද;

(ii) එම ගොඩනැගිල්ල ඉදිකිරීමට ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(iii) ඒ අනුව එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම, වැඩ අවසන් කිරීම සහ ජනතා අයිතියට පැවරීම සඳහා නියමිත දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5202/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවයේ නියුතු මුස්ලිම් ආගමික බැතිමතුන් උම්රා සහ හජ් ආගමික වන්දනාව සඳහා විදේශගත වීම සඳහා අවසර ලබා ගැනීමට ඉදිරිපත් කරන අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ලේඛන කවරේද;

(ii) අදාළ පුද්ගලයා ගුරුවරයකු වන විට, ඔහුට එම වන්දනා ගමන සඳහා වැටුප් සහිත නිවාඩු හිමි වන්නේද;

(iii) උම්රා වන්දනාව සහ හජ් වන්දනාව සඳහා විදේශගත වන අය සඳහා සරල අයදුම්පත් හා වීසා ලබාදීමට ක්‍රමවේදයක් සකස් කළ යුතු බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා මැදිහත්වීමක් සිදු කරන්නේද;

(v) ඉහත වන්දනා චාරිකාවේ යෙදෙන රජයේ සේවකයින් සඳහා අනුමත කරන නිවාඩු දින ගණන කොපමණද;

(vi) එම දින ගණන ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2731/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාන්පිටි මිල ඉහළ යාමත් සමග විවිධ ප්‍රදේශවල විවිධ මිල ගණන් යටතේ පාන් අලෙවි කරන බවත්;

(ii) පාන් ගෙඩියක තිබිය යුතු නියමිත බර ග්‍රෑම් 450 ක් වුවත්, මේ වන විට වෙළඳපොළෙහි අලෙවි කරනු ලබන පාන්වල එම නියමිත බර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පාන් ගෙඩියක තිබිය යුතු නියමිත බර හා පාන් ගෙඩියක් සඳහා වන නියමිත මිල පිළිබඳව අදාළ නිලධාරීන් විසින් බේකරි හිමියන් හා පාන් අලෙවි කරන්නන් දැනුවත් කර තිබේද;

(ii) නියමිත බර නොමැති හා නියමිත මිලට වඩා වැඩි මිලකට පාන් අලෙවි කරන්නන් නීතියේ රැහැනට හසුකර ගැනීමට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3311/'12

ගරු රවී කරුණානායක මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු - නැගෙනහිර යුද්ධයෙන් පසුව, 2010 සැප්තැම්බර් මාසයේ සිට මේ දක්වා පුද්ගලයින් රඳවා තබන සරණාගත කඳවුරු තිබේ නම්;

(i) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(ii) එලෙස රඳවා තබාගෙන ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2010 සැප්තැම්බර් මාසයේ සිට මේ දක්වා;

(i) එල්.ටී.ටී.ඊ. සැකකරුවන් ලෙස අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් කඳවුර තුළ රඳවා තබාගෙන ඇති සැකකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන්ට ලබාදෙන පුහුණු කවරාකාරද;

(iv) ඔවුන්ගේ අනාගත සුභසිද්ධිය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?